ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies
60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2019 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2019

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලු සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. දේවාලයක් අසල පළතුරු වට්ටි ඉල්ලුම අධීක්ෂණය කළ සේනානි විසින් පළතුරු මිලට ගෙන අළෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. මේ සඳහා ඔහු විසින් විවිධ ප්‍රදේශවල පළතුරු නිෂ්පාදකයන්ගෙන් පළතුරු මිලදී ගන්නා අතර අදාල ප්‍රවාහන කටයුතු තම ලොරි රථය යොදා ගෙන සිදු කරනු ලැබේ. මෙම ව්‍යාපාරය "සේනා පළතුරු වෙළෙඳ සැල" ලෙස නම් කරන ලද අතර ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී සිය බිරිඳගේ සහය ද ලබා ගනී.

සේනානි මිනුවන්ගොඩ මහජන බැංකුවේ ජංගම ගිණුම් හිමිකරුවෙකි. ඉතා විශ්වාසවන්ත ගනුදෙනුකරුවෙකු වන මොහු ට බැංකුවේ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ 10% බැංකු ණය, රු. 30,000 අනුමත වී ඇත. මොහු 2018.01.01 දින එම ණය මුදල, තමා සතුව තිබූ රු. 50,000 ක මුදල ද රු. 120,000 ක් වටිනා මෝටර් රථය ද යොදා ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

2018.01.03 අත්පිට ගැණුම් රු. 30,000
2018.01.05 ණයට ගැණුම් රු. 10,000
2018.01.07 අත්පිට විකුණුම් රු. 25,000
2018.01.20 කඩකුලි රු. 3,000
2018.01.31 ජල හා විදුලි බිල රු. 1,500

ජනවාරි මාසයට අදාල පහත තොරතුරු ද සපයා ඇත.
2018.01.31 දිනට තොගය රු. 15,000
මාසය සඳහා ලොරි රථයේ ක්ෂය රු. 1,000

i. සේනා වෙළෙඳ සැල අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කර, එහි වාසියක් හා අවාසියක් බැගින් ලියන්න.
ii. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ ද? නොවේ ද ? පැහැදිලි කරන්න.
iii. මෙය කුමන වෙළෙඳාම් වර්ගයකට අයත් වේ ද? එහි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
iv. මෙම ව්‍යාපාරයට අදාල බෙදාහැරීම් ක්‍රියාවලිය කුමක් ද ?
v. ව්‍යාපාරය ආරම්භයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයක දක්වන්න.
vi. 2018 ජනවාරි මාසය සඳහා සේනා ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කරන්න.
vii. මෙම ව්‍යාපාරයේ පිළියල කළ හැකි මූලික පොත් දෙකක් නම් කරන්න.
viii. ජනවාරි මාසය අවසානයේ දැකිය හැකි ජංගම වත්කම් 2 ක් හා එහි වටිනාකම් සහිතව ලියා දක්වන්න.
ix. මෙම ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු අතරින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ගිණුම් වලට නිදසුන බැගින් දෙන්න.
x. සේනානි ගෙවිය යුතු වාර්ෂික ණය පොළිය කීය ද?

(ලකුණු 20 යි)

## I **කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් ව්‍යාපාරික දුර්වලතාවක් හා බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් අවස්ථාවක් නම් කරන්න

ii. කුඩා පරිමාණයේ තේ කොළ පැකට්කර අළෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය සජිත්, ව්‍යාපාරය පුළුල් කිරීමට අදහස් කර නයනජිත් ව්‍යාපාරයට බඳවා ගනී. නව ව්‍යාපාරය තුළින් අයත්වන ප්‍රතිලාභ 2 ක් සඳහන් කරන්න.

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

❖ ප්‍රාග්ධනය නිෂ්පාදන සාධකයකි.

❖ විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමකි.

❖ ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයෙන් ලැබෙන තර්ජනයකි.

❖ දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදී යාම, ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර සඳහා හිතකර ලෙස බලපායි.

iv. අ. රාජ්‍ය දෙපාර්තමේන්තුවක වාසි දෙකක් සඳහන් කරන්න.

ආ. රාජ්‍ය සංස්ථා හඳුනා ගත් හැකි තවත් නම් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 08 යි)

03. i. නුවරඑළිය ප්‍රදේශයේ දැඩි වර්ෂාපතනය හේතුවෙන් කොළඹ ප්‍රදේශයේ එළවළු මිල ගණන් ඉහළ ගොස් ඇත. මෙම කියමන තුළ ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

ii. ස්වරූපය අනුව වර්තමානයේ වර්ග කළ හැකි සිල්ලර වෙළෙඳ සැල් මොනවා ද?

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

❖ අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජනය ලැබෙන පරිදි සම්පත් භාවිත කිරීම කාර්යක්ෂතාව නම් වේ.

❖ අවශ්‍ය සම්පත්, තනතුරු හා වැඩ බෙදා හැරීම සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම්කරණය වේ.

❖ බාහිර සන්නිවේදනයේ දි යවන්නා හා ලබන්නා අතර සාපේක්ෂව අඩු දුරක් පවතී.

❖ ජිවිත රක්ෂණයක දී රක්ෂිතයාට කැමති වටිනාකමටකට තම ජිවිතය රක්ෂණය කළ හැක.

iv. රටක මාර්ග පද්ධතිය සංවර්ධනය වීම තුළින් ව්‍යාපාරිකයින්ට අත්කර ගත හැකි ප්‍රතිලාභ කවරේද ?

(ලකුණු 08 යි)

## II **කොටස - ගිණුම්කරණය**

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. i. ගොඩනැගිලි ද්‍රව්‍ය අළෙවි කරන මයුරගේ ව්‍යාපාරයේ 2019.01.31 දිනෙන් අවසන් වූ මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

01. රු. 100,000 ප්‍රාග්ධනයක් යෙදවීම.
02. රු. 80,000 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ණයට ගැනීම
03. රු. 30,000ක් ණයහිමියන්ට ගෙවීම
04. රු. 15,000 ක ගොඩනැගිලි ද්‍රව්‍ය රු. 20,000 ක අත්පිට මුදලට විකිණීම.
05. මයුර පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 10,000 ක ව්‍යාපාරයෙන් ගැනීම

**අවශ්‍ය වන්නේ,**

ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක් වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත ආකෘතිය භාවිත කරන්න. පළමු ගනුදෙනුව සටහන් කර ඇත.)

| ගනු දෙනුව | වත්කම් | | | හිමිකම් + | වගකීම් (රු.) | |
|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර | තොගය | මුදල් | හිමිකම් | බැංකු ණය | ණයහිමියෝ |
| 2019 01/01 | 120,000 | 80,000 | 40,000 | 160,000 | 50,000 | 30,000 |
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |
| 04 | | | | | | |
| 05 | | | | | | |

2019.01.31 දිනට ව්‍යාපාරයේ පහත සඳහන් අයිතම් වල අගය සොයන්න.

01. ජංගම නොවන වත්කම් 02. ජංගම වත්කම් 03. ජංගම නොවන වගකීම්

04. ජංගම වගකීම් 05. අයිතිකරුගේ හිමිකම

ii. ඕලුගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මාසයට අදාල සුළු වියදම් මෙසේ ය.

| | | |
|---|---|---|
| 2019/01/01 | අත ඉතිරි | රු. 1,492 |
| | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | රු. 3,508 |
| 01/05 | ලොරි කුලි ගෙව්වා | රු. 1,200 |
| 01/09 | ගෙනඒමේ කුලි | රු. 800 |
| 01/14 | සංග්‍රහ ගාස්තු | රු. 350 |
| 01/19 | ලිපිද්‍රව්‍ය ගාස්තු | රු. 425 |
| 01/22 | රාක්කයක් මිලට ගත්තා | රු. 1,500 |
| 01/26 | නෙළුම්ට ගෙව්වා | රු. 500 |
| 01/30 | මුද්දර ගත්තා | රු. 125 |

ගමන්, ලිපිද්‍රව්‍ය, තැපල් හා විවිධ යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක ඉහත ගනුදෙනු සටහන් කරන්න. අග්‍රිමය ප්‍රතිපූරණය කර දක්වන්න. (ලකුණු 12 යි)

05. i. හිමිසරගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 90,000 |
| ආරම්භක තොගය | 30,000 | |
| විකුණුම් | | 134,000 |
| ගැණුම් | 84,500 | |
| ණයහිමියෝ | | 32,000 |
| විදුලිය | 16,700 | |
| ණයගැතියෝ | 52,000 | |
| ගොඩනැගිලි කුලි | 28,800 | |
| දුන්වට්ටම් | 9,200 | |
| රක්ෂණය | 29,100 | |
| මුදල් ශේෂය | 17,600 | |
| බැංකු ණය | | 30,000 |
| අවිනිශ්චිත ගිණුම | 18,100 | |
| | 286,000 | 286,000 |

ඉහත ශේෂ පිරික්සුම පිළියෙළ කිරීමෙන් පසු පහත සඳහන් වැරදි සොයා ගන්නා ලදි.

01. ගෙවූ ගොඩනැගිලි කුලි රු. 3,000ක් සටහන් කර තිබුණේ විදුලිය ගාස්තු ගිණුමේ ය.
02. ගැණුම් ගිණුමේ ශේෂය රු. 8,600 ශේෂ පිරික්සුමේ බැරට සටහන් කර තිබුණි.
03. දුන් වට්ටම් රු. 1,200 අදාල ණයගැති ගිණුමේ රු. 2,100 ලෙස සටහන් කර ඇත.

**ඉහත තොරතුරු ඇසුරෙන්,**

01. වැරදි නිවැරදි කිරීමට අදාල ජනල් සටහන්
02. අවිනිශ්චිත ගිණුම පිළියෙළ කරන්න.

ii. රුවිදුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි (පිරිවැය) | 450,000 | |
| ප්‍රාග්ධනය | | 600,000 |
| 2018.01.01 තොගය | 40,000 | |
| ගැණුම් | 153,000 | |
| විකුණුම් | | 256,000 |
| 10% බැංකු ණය | | 100,000 |
| ණයගැතියෝ | 25,000 | |
| ණයහිමියෝ | | 12,000 |
| විදුලිය | 14,000 | |
| ලද වට්ටම් | | 4,500 |
| දුන් වට්ටම් | 8,500 | |
| බොල් ණය | 11,500 | |
| ගෙනඒමේ කුලි | 9,300 | |
| වරිපනම් | 10,000 | |
| මුදල් ශේෂය | 23,000 | |
| ප්‍රචාරණය | 18,200 | |
| මෝටර් රථ (පිරිවැය) | 350,000 | |
| මෝටර් රථ ක්ෂය වෙන් කිරීම | | 140,000 |
| | 1,112,500 | 1,112,500 |

**අමතර තොරතුරු.**

1. 2018.12.31 දිනට තොගය රු. 52,300
2. මොටර් රථ 10% සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කෙරේ
3. බොල් ණය රු. 5,000 ණයගැතියන්ගෙන් කපා හරින ලදි.

**අවශ්‍ය වන්නේ,**

i. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශණය
ii. 2018.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (ලකුණු 12 යි)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.